මාතලේ ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වැයකර තිබූ රු.4,006,852 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම හා ලැබියයුතු මුද්දර ගාස්තු ආදායම රු.11,839,090 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 10 ක වටිනාකම රු.29,007,666ක් වූ අතර, වර්ෂ එකක කාලයක් ඉක්මවූ රු.6,511,426 ක ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 14 ක වටිනාකම රු.16,085,453 ක් වූ අතර, වර්ෂ එකකට වැඩි කාලයක් ඉක්මවූ රු.8,381,693ක ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.
---------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 4 කට අදාළ එකතුව රු.84,821,311ක්වූ ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (i) 217 රීතිය | සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පී.එස්. 46 ප්‍රකාර ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (i) 218 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් සමීක්ෂණය කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු.2,421,989 ක කල් ඉකුත් වූ තැන්පතු 15 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) චක්‍රලේඛ හා වෙනත් | |
| 2015 මාර්තු 10 දිනැති අංක 03/2014 (i) දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ කාණ්ඩ අංක vi සහ මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 3/2/1/23 හා 2015 අගෝස්තු 26 දිනැති ලිපිය | බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව, රු.4,000 ක දුරකථන දීමනාවක් සභා ලේකම්ගේ වැටුපට එකතුකර ගෙවීම්කර තිබීම හේතුවෙන් 2015 ජූලි සිට 2016 දෙසැම්බර් දක්වා රු.36,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,033,610 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,480,164 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,553,446ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ආදායම් විෂයයන් 4ක රු. 11,710,254ක ආදායම වැඩිවීම හා වියදම් විෂයයන් 3ක රු. 2,408,897ක වියදම අඩුවීම බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය
------------------------

2.3.1 වරිපනම් බදු
---------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.641,992 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවති අතර, ඒ සම්බන්ධව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.2 වෙනත් ආදායම්
------------------

(අ) අක්කර බදු
-------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ආදායම රු.211,895 ක් වූ අතර, වර්ෂයේ ආරම්භක හිඟ අක්කර බදු ආදායමේ වූ රු.227,025 කින් වර්ෂය තුළ රු.22,421ක් හෙවත් සියයට 10ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) ජල ගාස්තු
-------------

සමාලෝචිත වර්ෂය අවසානයට අයවියයුතු මුළු හිඟ ජල ගාස්තු ආදායම වූ රු.4,812,167 කින් රු. 2,779,519 ක් හෙවත් සියයට 58 ක් වර්ෂයක් ඉක්මවා හිඟව පැවති අතර, එකී හිඟය තුල ජලසම්පාදන මණ්ඩලයෙන් ජල සම්බන්ධතා ලබාදී තිබූ පාරිභෝගිකයන් 248 දෙනෙකුගෙන් වසර තුනක කාලයක සිට අය නොවී පවතින රු.537,326 ක හිඟයක්ද පැවතුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------------

2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.925,533ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.16,191,986 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර
----------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව පනවන ලද අධිභාර වලට අදාලව 2016 දෙසැම්බර් 31 දිනට රු.1,426,708 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ අනුමත තනතුරු 11 ක පුරප්පාඩු 18 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, පුරප්පාඩු නොමැති තනතුරු 6 ක් සඳහා 13 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත නොවූ ජල පාලකවරු 8 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.831,213ක දීමනාවක් සහා අරමුදලින් දරා තිබුණි.

(ඇ) වෙන්දේසි ඉඩම්වලින් සභාව සතුකරගෙන තිබූ ඉඩම් කට්ටි වලට අදාල මිනින්දෝරු සැලසුම් නොතිබුණු අතර, පරීක්ෂාවට ලක්කළ එවැනි ඉඩම් කොටස් 5 ක් පොදු කටයුත්තකට සුදුසු ස්ථාන වලින් ලබාගෙන වැට මායිම් යොදා ආරක්ෂිතව නොතිබුණි. සුසාන භූමි 8 කද අයිතිය සනාථ කළහැකි ඔප්පු නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අළුත්වැඩියා කර භාවිතයට ගතහැකි ලෙස හඳුනාගෙන තිබූ රු.295,631 ක් වටිනා අයිතම 17 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) සභාව සතුව පවතින අංක RA 8210 දරන ට්‍රැක්ටරය සඳහා 2016 වර්ෂය තුල රු.135,172 ක අළුත්වැඩියා වියදම් සහ රු.11,555 ක නඩත්තු වියදම් දරා තිබූ නමුත් එකී ට්‍රැක්ටරය ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවතුණි.

(ඊ) 2016 වර්ෂයේ අවස්ථා 19 කදී රු.350,830 ක වියදම් දරා සිදුකර තිබූ අංක RS – 1589 දරන බැකෝ යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු විධිමත්ව නොකිරීම නිසා 2016 ඔක්තෝබර් සිට නැවත අක්‍රීයව තිබූ බැවින්, සභා කර්මාන්ත සඳහා බාහිර පාර්ශවයන්ගෙන් බැකෝයන්ත්‍ර කුලියට ලබා ගැනීම සඳහා රු.840,000 ක් වැය කිරීමට සිදුව තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැඟිලි අයදුම්පත් 231ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණු නමුත්, ඉන් අයදුම්පත් 2 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් මාසයේදී ඉ-ශිල්පාගාර ව්‍යාපෘතිය යටතේ මිස්සක තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ඇති කිරීම සඳහා විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයෙන් සභාව වෙත පරිගණක 40ක්, පුටු 40ක්, මේස 40ක් හා ප්‍රොජෙක්ටරයක් ලබාදී තිබුණද, එම මධ්‍යස්ථානය 2016 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අයත් භූමියක වර්ෂ 8 කට පෙර සිට සුළු අපනයන බෝග මධ්‍යස්ථානයක් ඇතිකිරීමේ අරමුණෙන් අඩක් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ වැඩ නිමකර භාවිතයට ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම යටතේ අනුමත ප්‍රතිපාදන මුදල රු.2,915,000 ක් වූ කර්මාන්ත 10 ක් සහ සභා අරමුදල් යොදවාගෙන 2016 වර්ෂය තුළ ඉටුකිරීමට සැලසුම්කර තිබූ ප්‍රතිපාදිත මුදල රු.8,989,990ක්වූ කර්මාන්ත 17 ක් ඉටුකර නොතිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඇල්ලේපොල ජනසුවය ජල යෝජනා ක්‍රමයට පොම්පයක් මිලදී ගැනීම සඳහා රු.275,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් වර්ෂය තුළදී ව්‍යාපෘතිය ඉටු නොකිරීම හේතුවෙන් එකී ප්‍රතිපාදන අහිමිව තිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ මෙට්‍රික් ටොන් 2 කින් කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 400 ක් පමණ නිෂ්පාදනය කරන අතර, එකතුවන කසලවලින් ඉවත් කරන සියයට 40 ක පමණ පොලිතීන්, දාහකයක් යොදාගෙන පිළිස්සීම සිදුකරයි. මෙම දාහකය හා කසල කළමනාකරණ ඒකකයේ කටයුතු සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

(අ) ආදායම් විෂයයන් 5ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 34 සිට සියයට 92 අතර පරාසයක විචලනයන් පැවති අතර, වැය විෂයයන් 8 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදන සහ වියදම අතර, සියයට 33 සිට සියයට 86 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 5 කට අදාළව රු.3,230,000ක් වූ ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් උපයාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනය

----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) කාර්ය මණ්ඩල කළමනාකරණය.
(ආ) වත්කම් පාලනය.
(ඇ) වාහන පාලනය.
(ඈ) අයවැය පාලනය.
(ඉ) ගබඩා පාලනය.